# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### නැගෙනහිර දිස්ත්‍රික්කය සඳහා දුම්රිය මගට යොදන කලුගල් කියුබ් 7,000ක්, IPW/GNW සඳහා දුම්රිය මගට යොදන කලුගල් කියුබ් 1,000ක් සහ ගම්පොල අංගනය සඳහා දුම්රිය මගට යොදන කළුගල් කියුබ් 1,000ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

### IFB අංකය - SRS/F.8122

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), සභාපති විසින් නැගෙනහිර දිස්ත්‍රික්කය සඳහා දුම්රිය මගට යොදන කලුගල් කියුබ් 7,000ක්, IPW/GNW සඳහා දුම්රිය මගට යොදන කලුගල් කියුබ් 1,000ක් සහ ගම්පොල අංගනය සඳහා දුම්රිය මගට යොදන කලුගල් කියුබ් 1,000ක් මිලදී ගැනීම සඳහා දේශීය සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
3. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට 2025.09.02 දින සිට 2025.09.25 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයේදී වැඩිමනත් විස්තර ලබාගැනීමටත් ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | 94(11)4600204 හෝ 94(11)4600209 |
| **ෆැක්ස් අංකය** | : | 94(11)2432044 |
| **ඊමේල්** | : | srs.slr@gmail.com |
| **වෙබ් අඩවිය** | : | www.railway.gov.lk |

4. ලංසුකරු විසින් එම අයිතම හෝ සමාන අයිතම සැපයීම පිළිබඳව තමන්ට ඇති හැකියාව සහ ශක්‍යතාව පිළිබඳ ලිඛිත සාධක, වෙනත් ආයතන වෙත සැපයීම් වාර්තා සහ සපයන ලද භාණ්ඩවල කාර්යය සාධන සහතික සමග ලංසුව ඉදිරිපත් කළ යුතුය.
5. අභිලාෂී ලංසුකරුවන්ට ශ්‍රී ලංකාව, කොළඹ -10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රු. 32,000/= ක ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2025.09.02 දින සිට 2025.09.25 දින ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.
6. සෑම ලංසුවක් සමගම ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. 1,800,000.00 ක් වන අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.
7. ලංසු, 2025.09.26 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීමේ වේලාව අවසාන වූ වහාම ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F.8122**

**සභාපති,**
**දෙපාර්තමේන්තු (මහා) ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**